සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නර්තනය - I

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. උඩරට නව වන ගොඩ සරඹය ඇසුරින් සම්පූර්ණ වූවකි,

(1) බඹර සරඹය (2) චන්ද්‍රිකා සරඹය (3) පැනීම් සරඹය (4) අංගහාර සරඹය

02. සිංදු වන්නම් යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) උඩරට වන්නම් ය. (2) පහතරට වන්නම් ය.

(3) සබරගමු වන්නම් ය. (4) ද්‍රවිඩ වන්නම් ය.

03. 'සකපෝරුව' භාවිතා කරනු ලබන කර්මාන්තය වනුයේ,

(1) පතල් කර්මාන්තයයි. (2) කොහු කර්මාන්තයයි.

(3) තේ කර්මාන්තයයි. (4) මැටි කර්මාන්තයයි.

04. 'සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට' මෙහි දෙවන පාදය වන්නේ,

(1) පෙන්වා රඟ දෙති ලීල සභාවට (2) අපි දැන් දක්වමු ඒ රඟ සබයට

(3) බසිමින් චාමර ගත්තේ සුරතට (4) ගනිමින් චාමර සැළුවේ මුනිඳුට

05. ආංගික අභිනය යනු,

(1) මුහුනෙන් අදහස් ප්‍රකාශ කිරීම ය.

(2) වචන මඟින් අදහස් ප්‍රකාශ කිරීම ය.

(3) අග පසඟ භාවිතය මඟින් අදහස් ප්‍රකාශ කිරීම ය.

(4) වේෂ නිරූපණය හා රංගවස්ත්‍රාභරණ මඟින් අදහස් ප්‍රකාශ කිරීම ය.

06. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් **නොවන්නේ**,

(1) ගැටබෙරය (2) සෝෂක බෙරය (3) දඬු බෙරය (4) දවුල

07. නර්තනය ප්‍රධාන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කෙරෙන නාට්‍ය විශේෂය වන්නේ,

(1) මුද්‍රා නාට්‍යයයි. (2) ගීත නාට්‍යයයි.

(3) ස්වභාවික නාට්‍යයයි. (4) ශෛලිගත නාට්‍යයයි.

08. මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් ප්‍රසංග වේදිකාවට උචිත ලෙස නව රංග රටා මවමින් සකස් කළ නර්තන අංගය වනුයේ,

(1) ගොයම් ය. (2) නාරිලතා ය. (3) මෝල්ගස් ය. (4) රබන් ය.

Past Papers Wiki

09. උඩරට නර්තන සම්ප්‍රදායේ ගායනා රහිත නර්තන අංගයකි,

(1) අස්නේ (2) මඩුපුරය (3) යක් ඇන්නුම (4) කොහොඹා හැල්ල

10. වජීරා චිත්‍රසේන මහත්මිය විසින් **කරදිය** හා **නල දමයන්ති** මුද්‍රා නාට්‍යයන්හි දායකත්වය සැපයූ චරිත දෙක වන්නේ,

(1) සිසි හා දමයන්ති ය. (2) සිසි හා කාලි ය.

(3) හංස ධේනුව හා සිසි ය. (4) සිසී හා හංස ධේනුව ය.

11. ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත් ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේ ය.'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) ඉබන් බතූතාගේ වාර්තාවේ ය. (2) රොබට් නොක්ස්ගේ වාර්තාවේ ය.

(3) ස්පිල් බර්ජන්ගේ වාර්තාවේ ය. (4) පාහියන් භික්ෂුවගේ වාර්තාවේ ය.

12. ''මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ.....'' ගීතය ඇතුළත් නාට්‍ය වනුයේ,

(1) බෙරහඬ (2) විදුර (3) නරිබෑණා (4) වෙස්සන්තර

13. සොකරි නාටකයේ අන්තර්ගත චරිතයක් වන්නේ,

(1) නොංචි ය. (2) ලෙන්චිනා ය. (3) මුදලි ය. (4) ආඬිගුරු ය.

14. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ''කෙමෙත්ත'' පළඳිනු ලබන්නේ,

(1) කණට ය. (2) මැණික්කටුවට ය. (3) හිසට ය. (4) බෙල්ලට ය.

15. උඩරට වන්නමක අන්තර්ගත කොටස් ගණන වනුයේ,

(1) හතකි (2) හයකි (3) පහකි (4) හතරකි

- පහත රූප සටහන් ඇසුරින් 16 - 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය



B රූපය



C රූපය



D රූපය

16. අත්‍යාබෙර වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩයක් දක්නට ලැබෙන්නේ,

(1) B රූපයේ ය. (2) A රූපයේ ය. (3) C රූපයේ ය. (4) D රූපයේ ය.

17. වරමුදු හා ඉල්ලම් දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩයක් වනුයේ,

(1) C ය. (2) A ය. (3) B ය. (4) D ය.

18. හරක් සිවිය භාවිතා කරමින් සකස් කරගනු ලබන වාදන භාණ්ඩයකි,

(1) B ය. (2) C ය. (3) D ය. (4) A ය.

19. බෙර වාදනය ප්‍රගුණ කිරීමේදී තත්, දිත්, තොං, නං යන බීජාක්ෂර වාදනය කරන වාද්‍ය භාණ්ඩය දක්නට ලැබෙන්නේ,

(1) A රූපයේ ය. (2) B රූපයේ ය. (3) C රූපයේ ය. (4) D රූපයේ ය.

20. කාලිංග වනෝද්‍යාන සෙල්ලිපිය ..... යුගයට අයත් වූවකි,

(1) පොළොන්නරු (2) කෝට්ටේ (3) අනුරාධපුර (4) යාපහුව

21. ''විස්මය'' නම් වූ ස්ථායිභාවය මුල්කර ගනිමින් උපදින්නේ,

(1) ශෘංගාර රසයයි. (2) කරුණා රසයයි. (3) අත්භූත රසයයි. (4) වීර රසයයි.

22. උඩැක්කියේ ආකෘතිය සහිතව කථකලී නර්තනයේ යොදාගන්නා වාද්‍ය භාණ්ඩයකි,

(1) චෙන්ගිලම් (2) එඩැක්ක (3) චෙන්ඩාව (4) කුම්භූ

23. කථකලි රංගවස්ත්‍රාභරණ අතර 'කුප්පායම්' යනු,

(1) යටිකයට අඳිනු ලබන විශාල රෙද්දකි.

(2) කරවටා පළඳින වේලයකි.

(3) උඩුකයට අඳිනු ලබන අත් දිග හැට්ටයකි.

(4) හිසට පළඳින ඔටුන්නකි.

24. සීතාහරණ මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළේ,

(1) 1930 වර්ෂයේදී ය. (2) 1933 වර්ෂයේදී ය.

(3) 1934 වර්ෂයේදී ය. (4) 1936 වර්ෂයේදී ය.

25. කුඹි කථාව මුද්‍රානාට්‍යය රංගරචනය කරනු ලැබුවේ,

(1) ටානියා බැරකෝමා ය. (2) අංජලීකා චිත්‍රසේන ය.

(3) මහේෂ් උමගලිය ය. (4) රොබට් ජුලියන් ය.

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු වගුව ඇසුරින් ලියන්න.**

පේළිය	A තීරුව	B තීරුව	C තීරුව	D තීරුව
1.	සොකරි	හොරණෑව	සාරංගි	කුම්භූ
2.	ලෙන්චිනා	උදයශංකර්	කථක්	ජසයා
3.	බටනලාව	සොත්තානා	කථකලී	සිංකිඩ්

26. ඉන්දියානු නර්තන සම්ප්‍රදායන් අතුරින් වඩාත් පොහොසත් වේෂනිරූපනයක් දක්නට ලැබෙන්නේ,

(1) 3 පේළියේ C තීරුවේය. (2) 2 පේළියේ C තීරුවේය.

(3) 1 පේළියේ A තීරුවේය. (4) 2 පේළියේ A තීරුවේය.

27. ''තත්'' වාද්‍ය භාණ්ඩයක් දක්නට ලැබෙන්නේ,

(1) 1 පේළියේ D තීරුවේය. (2) 1 පේළියේ C තීරුවේය.

(3) 3 පේළියේ A තීරුවේය. (4) 1 පේළියේ B තීරුවේය.

28. 2 පේළියේ D තීරුවේ සඳහන් චරිතයේ ලක්ෂණයක්,

(1) නිමතමානී හා අන් අයට ගරුකරණ චරිතයකි.

(2) අහංකාර බව හා කපටි චරිතයකි.

(3) බීමත් හා පුරසාරම් දොඩවන උද්දච්ච චරිතයකි.

(4) අන්අයට ගරුකරණ එහෙත් කපටි චරිතයකි.

29. කෝළම් නර්තන සම්ප්‍රදාය සඳහා යොදා ගන්නා සුෂිර වාද්‍ය භාණ්ඩය ඇතුළත් නිවැරදි වරණය,

(1) 3 පේළියේ A තීරුවේය. (2) 1 පේළියේ D තීරුවේය.

(3) 1 පේළියේ B තීරුවේය. (4) 1 පේළියේ C තීරුවේය.

30. 3 පේළියේ B තීරුවේ සඳහන් සොත්තානා,

(1) ගුරුහාමිගේ පුතාය. (2) වෙදරාළගේ පුතාය.

(3) ජසයාගේ පුතාය. (4) ලෙන්චිනාගේ පුතාය.

31. ''උඩරට'' ගැමි නාටකයේ කාන්තා චරිතයකි,

(1) 1 පේළියේ A තීරුව (2) 3 පේළියේ B තීරුව

(3) 2 පේළියේ A තීරුව (4) 1 පේළියේ C තීරුව

32. මැදුම් තනි තිතට වැයෙන උඩරට නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදයකි,

(1) දොදොංත තකු දොම් (2) ජිංගත ගො ගො

(3) දොං ජිංත ගත දොංත (4) දෝං ජිං ජිං තකට දොංතකු

33. ''තාම් දොම්තිගත ..... කඩතක තරිකිට .....'' මෙම අඩව් කොටස සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන්නේ,

(1) තකට, තත්තකට (2) තක රොං, ගජිං (3) දොම්කිට, කිතක (4) තත් ජිත්, කිතක

34. සබරගමු නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

(1) කුරුණෑගල, කොළඹ (2) බලංගොඩ, රත්නපුර

(3) රත්නපුර, බෙන්තර (4) රත්නපුර, සීනිගම

35. පහතරට නර්තනය හා බැඳුනු නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා වනුයේ,

(1) ගුරුගේ මාලාව හා මී බන්ධනය (2) රාමා යක්කම හා අසුර යක්කම

(3) අඹ විදමන හා දෙවොල් ගොඩබැසීම (4) ගබඩා කොල්ලය හා අසුර යක්කම

36. උඩරට මඟුල් බෙර වාදනයෙන් පසු කරනු ලබන යුගල බෙර වාදනය හඳුන්වන්නේ,

(1) වන්දමානම් යනුවෙනි. (2) අත්‍යාබෙර වාදනය යනුවෙනි.

(3) අභින පද යනුවෙනි. (4) යක්තුන්පදය යනුවෙනි.

37. මන්දමානසික දරුවන්ගේ කුසලතා ඔප් නංවා ඔවුන් සමාජගත කිරීමට කැප වූ කෙනෙකි,

(1) මිරැන්ඩා හේමලතා මහත්මිය (2) වජිරා චිත්‍රසේන මහත්මිය

(3) එස්. පණිභාරත මහතා (4) කේ.එස්. ප්‍රනන්දු මහතා

38. මාත්‍රා 123 / 1234 යනුවෙන් යෙදෙන තාලරූපය හඳුන්වනු ලබන්නේ,

(1) මහ තනි තිත යනුවෙනි. (2) සුළු මහ දෙතිත යනුවෙනි.

(3) මැදුම් මහ දෙතිත යනුවෙනි. (4) සුළු මැදුම් දෙතිත යනුවෙනි.

39. ප්‍රස්තාරකරණයේ දී **ඇදෙන මාත්‍රා** හා **නොඇදෙන මාත්‍රා** හඳුන්වන්නේ,

(1) ගුරු මාත්‍රා හා ලඝු මාත්‍රා යනුවෙනි. (2) ලඝු මාත්‍රා හා ගුරු මාත්‍රා යනුවෙනි.

(3) ගුරු මාත්‍රා හා දෘත මාත්‍රා යනුවෙනි. (4) ගුරු මාත්‍රා හා ප්ලුත මාත්‍රා යනුවෙනි.

40 කොහොඹා කංකාරී ශාන්තිකර්මයේ දී ඇදුරන් හඳුන්වන්නේ,

(1) කපුමහතා ලෙස ය. (2) පත්තිනිහාමි ලෙස ය.

(3) යක්දෙස්සා ලෙස ය. (4) ගුරුන්නාන්සේ ලෙස ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නර්තනය - II

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

(01) නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

(i) මණ්ඩියට සිටීමේදී පාද අතර තිබිය යුතු දුර ප්‍රමාණය ..... කි.

(ii) ''තවද උෂ්ණත් මුවන් සාවුන් වෙඩි තියන්නට .....'' මෙය ..... කි.

(iii) ශ්‍රී ලංකාවේ ගැමි නැටුම් අතරින් ආතත වාද්‍ය භාණ්ඩයක් උපයෝගී කරගෙන ..... නැටුම ඉදිරිපත් කරයි.

(iv) මණ්ඩම නමින් හඳුන්වන කොටස අයත් අවනද්ධ භාණ්ඩය ..... වේ.

(v) ''උඩරට නැටුම් කලාව'' යන කෘතිය ලියා පළ කරන ලද්දේ ..... විසිනි.

(vi) අතීතයේ රජුගේ පණිවිඩ ජනතාව අතරට රැගෙන ගියේ ..... වාදනය මඟිනි.

(vii) රජරට ප්‍රදේශයේ සොකරි රඟ දැක්වීමේදී ..... නමැති වාද්‍ය භාණ්ඩය යොදා ගනී.

(viii) රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ, වේදිකා සැරසිලි හා ආලෝකකරණය යන ආනුශාංගික කලාවන් ..... අභිනයට අයත් වේ.

(ix) සැළලිහිණිය හා නලදමයන්ති යන මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරනු ලැබුවේ,

1. සැළලිහිණිය : .....
2. නල දමයන්ති : .....

(x) නැටුම් ගැයුම් හා වැයුම් වලදී තාල තැබීමට පෙර හා තාල තැබීමට පසු ගායනය කිරීම හඳුන්වනු ලබන්නේ,

1. තාල තැබීමට පෙර : .....
2. තාල තැබීමට පසු : .....

$(2 \times 2 = 4)$

(මුළු ලකුණු 12)

(02) (i) සුළු මැදුම් දෙතිතට අදාල බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) ''සුරිදුන් පෙර සිටන් බලයුත් සැව තිඳුන්'' යන කවි පදය මාත්‍රා 2 + 4 තාලරූපයට ප්‍රස්තාර කරන්න.

(iii) සිංහරාජ වන්නමේ අඩවිව මහ තනිතිතට ප්‍රස්තාර කරන්න.

(ලකුණු 4 × 3 = 12)

(03) පහත සඳහන් මාතෘකා ඇසුරින් මාතෘකා 03 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය (ii) සොකරි රඟමඬල (iii) මිරැන්ඩා හේමලතා

(iv) රබන් ගායනා (v) ස්වස්ථතාව (ලකුණු 4 × 3 = 12)

(04) ''ශාන්ති කර්ම වූ කලී දේශීය සංස්කෘතික උරුමය පිළිබඳ කැඩපතකි.''

(i) ත්‍රිවිධ සම්ප්‍රදායන්හි ප්‍රධාන ශාන්ති කර්මවල දැකිය හැකි පොදු චාරිත්‍ර විධි 04 ක් නම් කරන්න. (ල.04)

(ii) පහන් මඩුව හා දෙවොල් මඩුව යන ශාන්ති කර්ම දෙකෙහිම භාවිත පොදු නර්තන අංග දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.04)

(iii) කොහොඹා කංකාරියේ පුරාවෘත්ත කතාවෙන් සමාජයට ලබාදෙන යහපත් ආකල්ප පිළිබඳ ඇගයීමක් කරන්න. (ල.04)

(ලකුණු 4 × 3 = 12)

(05) (i) නර්තන කලාවට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳව මහා වංශයේ සාධක දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න. (ල.04)

(ii) නර්තන කලාවට විදේශීය ආභාෂය ලැබුණු බවට සෙල්ලිපියක් ඇසුරින් කරුණු දක්වන්න. (ල.04)

(iii) නැටුම්, ගැයුම්, වැයුම් සඳහා සරස්වතී මණ්ඩපය ඉදිකළ රජතුමා පිළිබඳව ඇගයීමක් කරන්න. (ල.04)

(ලකුණු 4 × 3 = 12)

(06)



A


B


C

(i) A රූපයේ දැක්වෙන මුද්‍රානාට්‍යය නම්කර එම මුද්‍රා නාට්‍යයේ චරිත තීව්‍ර කිරීමෙහිලා රංග වස්ත්‍රාභරණ වලින් ලැබෙන දායකත්වය අගය කරන්න. (ල. 04)

(ii) B රූපයෙහි දැක්වෙන ගැමි නාටකයට අදාල චරිත 02 ක් නම්කර ඉන් එක් චරිතයක් පිළිබඳව විස්තර කරන්න. (ල. 04)

(iii) C රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එහි භාවිත සංගීතය පිළිබඳව විස්තර කරන්න. (ල. 04)

(ලකුණු 4 × 3 = 12)

(07) (i) සරල අංග රචනය යන්න පැහැදිලි කරන්න. (ල. 04)

(ii) බෙරහඬ වේදිකා නාට්‍යයේ නාට්‍ය ගීතය ලියා එහි පද රචකයා හා ගායකයා නම් කරන්න. (ල. 04)

(iii) ප්‍රසංග වේදිකාවට උචිත ලෙස ගැමි නැටුමක් නිර්මාණය කිරීමේදී ඔබ යොදා ගන්නා උපක්‍රම 04 ක් පිළිබඳව විස්තර කරන්න. (ල. 04)

(ලකුණු 4 × 3 = 12)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

අනු අංකය	ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර	ලකුණු
(01)	**ක්‍රියාකාරකම - ගායනය හා වාදනය**	
	(i) කැමති ගායනය	5
	(ii) නම්කරන ලද ගායනය (සොකරි, රබන්, චාමර, ඔංචිලි වාරම්, නමස්කාර, ටීකා)	5
	(iii) කැමති බෙර සරඹයක් තාල තබා කීම හා වාදනය	5
	(iv) කැමති බෙර පදයක් තාල තබා කීම හා වාදනය	5
	මුළු ලකුණු	20
(02)	**ක්‍රියාකාරකම - සරඹ හා ගැමි නැටුම්**	
	(i) 6 සිට 12 දක්වා ගොඩ සරඹ වලින් එකක් මධ්‍ය ලයට කස්තිරම සමග නැටීම	10
	(ii) ගැමි නැටුම් (අලංකාර මාත්‍රා දෙකක් සමග)	10
	රබන් / චාමර (කුසපත් ඇදීම මගින්) මුළු ලකුණු	20
(03)	**ක්‍රියාකාරකම - වන්නම් නර්තනය සම්පූර්ණයෙන්**	
	සිංහරාජ/ සැවුලා	
	(i) පද දෙකක් නර්තනය	04
	(ii) තාලාවබෝධය සිසු ශක්‍යතාවය	04
	(iii) ගායනය	04
	(iv) කස්තිරම, සීරුමාරුව, අඩව්ව නැටීම	08
	මුළු ලකුණු	20
(04)	**ක්‍රියාකාරකම වෘත්තිය හා බැඳි නර්තනය**	
	කර්මාන්ත ආශ්‍රිත නර්තන නිර්මාණය	
	ධීවර / පතල් / කොහු / තේ / මැටි /	
	(නිර්ණායක අභිමත පරිදි සකස් කර ගත හැකිය) මුළු ලකුණු	20
(05)	**නිර්මාණ හා කුසලතා**	
	නාට්‍ය ගීතය අනුව නර්තනය නිර්මාණය	10
	මෙම ගිම්හාන / හනික වරෙව් කොල්ලනේ / දී කිරි දී කිරි	10
	නර්තන නිර්මාණය - රජ කුමරිය / හංසයා / මහළු කාන්තාව / ධීවරයා / ගොවියා / සිංහයා	
	මුළු ලකුණු	20
	වැදගත් : ලකුණු පිරිනැමීමේදී ගුරුවරයාට අභිමත පරිදි සකස් කරගත හැකිය. මුළු ලකුණු	100

පිළිතුරු පත්‍රය - I කොටස

01. (2)	02. (2)	03. (4)	04. (3)	05. (3)	06. (3)	07. (1)	08. (3)	09. (3)	10. (4)
11. (3)	12. (2)	13. (4)	14. (2)	15. (2)	16. (2)	17. (1)	18. (1)	19. (2)	20. (1)
21. (3)	22. (2)	23. (3)	24. (4)	25. (2)	26. (1)	27. (2)	28. (3)	29. (3)	30. (2)
31. (1)	32. (2)	33. (3)	34. (2)	35. (3)	36. (2)	37. (1)	38. (3)	39. (1)	40. (3)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

II කොටස

(01) (i) මිටි රියනක් (ii) ටීකාව (iii) රබන්
(iv) තම්මැට්ටම (v) ජේ.ඊ. සේදරමන් මහතා (vi) අණබෙර
(vii) උඩැක්කිය (viii) ආහාර්ය
(ix) 1. සැළලිහිණිය : ප්‍රේම කුමාර එපිටවල මහතා.
2. නල දමයන්ති : චිත්‍රසේන ඩයස් මහතාය
(x) 1. විෂම ග්‍රහ 2. අව ග්‍රහ (ලකුණු 12)

(02) (i)

^		/			^		/		
1	2	1	2	3	1	2	1	2	3
දොං	-	ජිං	-	ත	ග	ත	දොං	-	ත

තාල සංකේත දැක්වීමට ල. 2 යි.
ප්‍රස්තාර කිරීමට ල. 2 යි.

(ii)

^		/				^		/			
1	2	1	2	3	4	1	2	1	2	3	4
සු	-රි	දුන්	-	පෙ	ර	සි	-.	ටන්	÷	.	.
බ	ල	යුත්	-	සැ	ව	ති	.	දුන්	.	.	.

තාල සංකේත දැක්වීමට ල. 2 යි.
ප්‍රස්තාර කිරීමට ල. 2 යි.

(iii)

/				/				/				/			
1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
තා	÷	මි	දො	මි	නි	ග	ත	දො	මි	කි	ට	කුඩ	තක	තරි	කිට
කි	ත	ක	දො	මි	ති	ග	ත	කිත්	.	තත්	.	කු	ඳ	කු	ඳ
තා	.	කු	ජිත්	.	ත	ග	ත	දො	මි	කි	ට	තරි	කිට	කුං	දත්
තා															

තාල සංකේත දැක්වීමට ල. 2 යි. ප්‍රස්තාර කිරීමට ල. 2 යි. (ලකුණු 4 × 3 = 12)

(මුළු ලකුණු 12)

(03) (i) <u>සතර අභිනය</u> :
- අභිනය නිර්වචනය කිරීම.
- සතර අභිනය නම් කිරීම.
- ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත අවස්ථා නම් කිරීම.
- භරතමුණි, කන්දිකේශ්වරයන්ගේ ග්‍රන්ථ ඇසුරින් තොරතුරු දක්වා තිබීම.

(ii) <u>සොකරි රඟමඬල</u> :
- වෘත්තාකාර රඟ මඩලකි.
- කමත රඟමඬල ලෙස යොදා ගැනේ.
- වංගෙඩිය මුනින් හරවා එය උඩ ලංතැරුමක් රඟමඬල මැද තබා ඇත.
- පසෙක මල් පැළ සහ ගායන වෘන්දය වේ.

PAST PAPERS WIKI

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(iii) මිරැන්ඩා හේමලතා : 1938 නොවැම්බර් 15 වන දින කැළණියේ දළුගම ග්‍රාමයේ උපත ලැබූ මිරැන්ඩා හේමලතා මහත්මිය රජයේ ලලිත කලායතනයේ නර්තනය හදාරන ලදී. අඩයාර්ෆි කලා ක්ෂේත්‍රම් ආයතනයෙන් භරත නර්තන සම්ප්‍රදාය ප්‍රගුණ කරන ලදී. භරත නර්තන ශිල්පිනියක ලෙස ප්‍රසිද්ධ විය.

* දේශීය නර්තන කලාවට සුවිශේෂී මෙහෙවරක් ඉටුකළ කෙනෙකි. සමස්ත ලංකා තරග ක්‍රමවත්ව ආරම්භ කිරීම. කථිකාචාර්යවරියකි. ගුරු අත්පොත් සකස් කිරීම. විෂයමාලා සකස් කිරීම. ගුරු මාර්ගෝපදේශ සැකසීම. ආදී සුවිශේෂී මෙහෙවරක් කළ රාජ්‍ය නිලධාරිනියකි.

(iv) රබන් ගායනා :

- විනෝදාස්වාදය මුල් කොට ගෙන නිර්මාණය වී ඇති ගායන විශේෂයකි.
- බොහෝ රබන් කවි තේමා කොට ගෙන ඇත්තේ බුදුගුණ වර්ණනාවන්ය.
- රබන් කවි සඳහා එරන්දතී වර්ණනාවට අයත් කවිද ගායනා කරනු ලැබේ.
- විවිධ නාදමාලාවන්ට හා තිත් රූපවලට අනුව ගායනා කරනු ලබයි.
- රබන් කවි ගායනයේ දී ''වයන්ති මාලයට'' අයත් කවි ගායනා කරයි.

(v) ස්වස්ථතාව :

ස්වස්ථතාව යනු කායික හා මානසික සුවතාවයයි. මෙය කායික හා මානසික වශයෙන් කොටස් දෙකකි. මිනිසා තුළ නිතැනින් ඇතිවන ශාරීරික තත්වයන් ඉක්මවා ගොස් මානසික, සමාජීය, අධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඇතුලත් වන සංසිද්ධියයි. (ලකුණු $4 \times 3 = 12$)

(04) (i) කප් සිටුවීම / තොට පේ කිරීම / රුක් පේ කිරීම / මඩු පේ කිරීම

(ii) තෙල්මේ නැටීම / හත්පද පෙළපාලි

- තෙල්මේ නැටීම : සමූහ නර්තනයකි. මඩු භූමියෙහි තෙල්, මල්, පහන් තටුවක් තබා කන්නලව් කොට අනතුරුව නර්තන දැක්වීම සිදු කෙරේ.
- හත්පද පෙළපාලි : හත් පදයට අයත් පූජා භාණ්ඩ රැගෙන, ගායනය සමඟ කෙරෙන ඒකල නැටුම් විශේෂයකි. ගායනය සහිතව ඉදිරිපත් කෙරේ. (පෙළ පාලි 2 නම් කිරීමට ල. 2 යි. / එක් නර්තන අංගයක් විස්තර කිරීමට ල. 2 යි.)

(iii)

- යම් පුද්ගලයෙකුට අසාධාරණයක් සිදු කළ විට වෛරය පළිගැනීම යන චේතනා ඇති වන බව.
- ස්වභාව ධර්මය මගින් එම අකටයුතුකම්වලට දඬුවම් ලැබෙන බව.
- කායකයකු පොරොන්දු කඩ කිරීමෙන් සමාජ අගතියට පත් වන බව.
- වැරදි කරන්නන්ට සමාජයෙන් දඬුවම් ලැබෙන බව.
- නිවැරදිකරුවන්ට සමාජයෙන් පැසසුම් ලැබෙන බව.
- අයහපත් නායකත්වය ප්‍රතික්ෂේප කරන බවත්, යහපත් නායකත්වය සඳහා මිනිසුන් ඒකරාශී වන බව දෙවියන් පවා එවැනි නායකත්වයට ගරු කරන බව. (ලකුණු $4 \times 3 = 12$)

(05) (i) මහාවංශයේ සාධක 02 ක් ඇසුරින් පිළිතුරු ලියා ඇත්නම් ලකුණු 04.

(ii)

- පාලමොට්ටායි ශිලා ලිපියට අනුව දේවදාසීන් සිටි බවත්, ලංකාව සොළීන්ට යටත් වූ පසු මෙවැනි ආකාරයට දෙවියන් සඳහා පූජා නැටුම් ආරම්භ වූ බව.
- නළලෙහි සලකුණු කළ දේවදාසීන් හත්දෙනෙකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් මුදලකින් කෑසි ගෙවූ බව, එකල වෘත්තිය නර්තන කලාවක් පැවති බව.
- ශිවදේව වන්දනය පොළොන්නරු යුගයේ මුල් බැස ගත් බව.
- සොළි ආධිපත්‍යයට නතු වීමෙන් භාරතීය සංස්කෘතික ලක්ෂණ ප්‍රචලිත වී ඇති බව.
- ආගමික මධ්‍යස්ථාන වල පූජාර්ථයෙන් නර්තනය භාවිත වී ඇතිබව.

(iii) පරාක්‍රම බාහු රජු :

- නර්තන කලා උදෙසා ඉමහත් සේවාවක් ලබා දී ඇතිබව.
- රාජකීයන්ගේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා නර්තන කලාව උපයෝගී කරගෙන ඇතිබව.
- රාජකීය සෙබලුන්ගේ ආස්වාදය උදෙසා නර්තනය යොදා ගෙන ඇතිබව.
- චරපුරුෂ සේවයේදී නාට්‍යාංගනාවන් භාවිත කර ඇතිබව.
- වෘත්තිය කලාවක් ලෙස නර්තනය යොදාගෙන ඇති බව. (ලකුණු $4 \times 3 = 12$)

පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(06) (i) කුඹී කතාව :-

- විවිධ වර්ණ රටාවන් වෙත නැඹුරු වී ඇත.
- වර්ණ සංයෝජනය උපරිම ලෙස දායක කර ගෙන ඇත.
- මහේෂ් උමගිලිය කලා ශිල්පියා විසින් ඇඳුම් නිර්මාණය කර ඇත.
- සත්ව චරිතයන්ගේ බාහිර පෙනුමට සජීවී බවක් ආරෝපණය කර ලීමට උත්සුක වී ඇත.

(ii) සොකරි, ගුරුහාමි

සොකරි :

- ප්‍රධාන ස්ත්‍රී චරිතයයි.
- සුරීපී බවින් අනූන අනුරාගී චරිතයකි.
- බැල්ම, හැසිරීම ලාලිත්‍යය ශෘංගාරාත්මකය.
- ලැජ්ජාශීලී බවක් දක්වයි.
- දොංජී ගත බෙර තාලයට සරල චලන ඉදිරිපත් කිරීම

ගුරුහාමි :

- වයස්ගත පුද්ගලයෙකි.
- සිංහල බස නොදත් නිසා අකරතැබ්බයන්ට මුහුණ දේ.
- හාස්‍ය රසය මතු කරයි.
- නැටුම් ශිල්පය දත් අයෙක් ලෙස සලකයි.

(චරිතය හැඳින්වීමට ල.02)

(iii) කථකලී නර්තන සම්ප්‍රදාය :

- දකුණු භාරතීය කර්ණාටක සංගීතයයි.
- ගීත ගායනය කෙරෙනුයේ සංස්කෘත හා මලයාලම් භාෂාවෙනි.
- ගායකයින් දෙදෙනෙකි. ප්‍රධානියා පොන්නානි / සහය ගායකයා සිංකිඩි
- චෙන්ඩාව මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වේ.
- මීට අමතරව චෙන්ගිලම්, ඉලතාලම්, එඩැක්කා, කුම්බු යන වාද්‍ය භාණ්ඩ ද වාදනය සඳහා යොදා ගැනේ.

(ලකුණු 4 × 3 = 12)

(07) (i)

- සරල අංග රචනය
- ශරීරයේ නළල, ඇස්, නාසය, කන්, අත් පා යන කොටස් වර්ණ හා හැඩතල භාවිතයෙන් හැඩ ගැන්වීමකි.
- කෙනෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කිරීම සරල අංග රචනයයි.
- නර්තනයේ දී භාවිත වේ.

(ii) ගීතය : බෙරහඬ නාට්‍යය

හනික වරෙව් කොල්ලනේ : ගීතය ලිවීමට ල. 02 යි. පද රචනය - බන්දුල ජයවර්ධන, ගායනය - ජැක්සන් ඇන්තනී } නම් කිරීමට ල. 02 යි

(iii)

- රංග රටා නිර්මාණය
- නිර්මාණශීලී චලන රටා
- විචිත්‍ර වූ රංග උපකරණ හා රංග භාණ්ඩ භාවිතය
- විවිධ රංග වස්ත්‍රාභරණ භාවිතය
- ගායන, වාදන, චලන වල මනා සංකලනය. (කරුණු 4 ක් විස්තර කිරීමට ල. 4 යි.)

(ලකුණු 4 × 3 = 12)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank